M351

# භාෂා ක්‍රියාකාරකම් විෂයයෙහි නිර්දේශිත අභිමතාර්ථ අනුව ලිවීමේ කුසලතාවයේදී ශිෂ්‍යයින්ගේ සාධන මට්ටම කවරාකාරයෙන් පවත්නේ ද යන්න පිළිබඳව 3 වසර ඇසුරින් කෙරෙන අධ්‍යයනයක්


එම්. එල්. විදානපතිරණ
ගුරු සහතික පත්‍රය - I පෙළ - 1966,
පුහුණු ගුරු සහතික පත්‍රය - I පෙළ - 1969,
ගුරු උපදේශක සහතික පත්‍රය - I පෙළ - 1972,
සාමාන්‍ය ශාස්ත්‍රවේදී,
අධ්‍යාපන ඩිප්ලෝමා (සම්මාන),
ශාස්ත්‍රපති,
අධ්‍යාපනපති


UCLIB
480857

කොළඹ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන දර්ශනපති උපාධි පරීක්ෂණයෙහි අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා ඉදිරිපත් කරන පර්යේෂණාත්මක නිබන්ධය

1995 - 1997

University of Colombo Library Sri Lanka

# සංක්ෂිප්ත සටහන

වර්ෂ 1995 දී ක්‍රියාත්මක මවුබස සිංහල විෂය නිර්දේශයෙහි දැක්වෙන අභිමතාර්ථ අනුව ලිවීමේ කුසලතාවයේ දී ශිෂ්‍යයින්ගේ සාධන මට්ටම කවරාකාරයෙන් පවත්වන්නේ දැයි 3 වසර ඇසුරු කොට මෙම අධ්‍යයනය සිදු කොට ඇත.

අධ්‍යයනයෙහි මූලික පරමාර්ථය වී ඇත්තේ ප්‍රාථමික අධ්‍යාපන අවධියෙහි මවුබස සිංහල ලිවීමේදී 3 වසර ශිෂ්‍යයින්ගේ සාධන මට්ටම කවරාකාරව පවත්නේ ද යනු විමසීමයි.

3 වසර සිසුන් ලිවීමේ දී දක්වන දුර්වලතා මොනවා දැයි හඳුනා ගැනීම හා එහි ලා බලපාන සාධක වල ස්වභාවයන් අවබෝධ කර ගැනීම ද අරමුණු අතර ප්‍රධාන වේ.

පහළ ප්‍රාථමික අවධියෙන් ඉහළ ප්‍රාථමික අවධියට පිවිසෙන 3 වසර දරුවාගේ ලිවීමේ කුසලතා මට්ටම තක්සේරු කිරීම ඉතා වැදගත් සේ සලකා ඇත. ලිවීමේ කුසලතාව ඉගෙනුම් - ඉගැන්වීම් කාර්යයෙහි දී සියළු විෂයයන්ට ප්‍රබල බලපෑමක් සිදු කරන බව සැලකිල්ලට ගෙන ඇත.

අධ්‍යයනයෙහි දී හඳුනා ගන්නා ලද ලිවීමේ දුර්වලතා හැකිතාක් අවම කර ගැනීම සඳහා ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියෙහි දී අනුගනය කළ හැකි ක්‍රම ශිල්ප කවරේ ද යනු නිගමනය වැදගත් කොට සලකා ඇත. ලිවීමේ සාධන මට්ටම වැඩි දියුණු කර ගැනීම සඳහා නව ප්‍රතිකාර්ය යෝජනා කිරීම ද අරමුණු කොට ඇත.

3 වසර සිසුන්ගේ දිනපතා පැමිණීම, පංති කාමර වාතාවරණය, ඉගෙනුම් - ඉගැන්වීම් සංවිධානය, ඇගැයීම හා ප්‍රතිකාර්ය යන අංශ කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් ප්‍රතිකාර්ය ඉදිරිපත් කිරීම අරමුණු අතර වේ.

බටහිර පළාත, වයඹ පළාත හා මධ්‍යම පළාත යන පළාත් තුනෙහි 1AB, 1C හා 2/3 යන පාසල් වර්ග වලින් පාසල් 40 බැගින් පාසල් 120 ක 3 වසර සමාන්තර පංති අතරින් අහඹු ලෙස එක පංතියක් බැගින් නියැදියට තෝරා ගැනීම සිදු කෙරිණ.

නියැදිය තෝරා ගැනීමේ දී නාගරික, අර්ධ නාගරික, ග්‍රාමීය වශයෙන් හා ජාතික පාසල්, පිරිමි විද්‍යාල, බාලිකා විද්‍යාල ඇතුළත් වන ලෙස නියැදියෙහි පාසල් නාම ලේඛනය සකසා ඇත.

අධ්‍යයනයෙහි දී 3 වසර සිසුන් ගේ ලිවීමේ කුසලතාව සුවිශේෂව පාදක කොට ගෙන ඇත. මෙහි දී ලිවීම යනුවෙන් අක්ෂර හා ඉලක්කම් යන අංශ දෙකෙහිම කුසලතාව අදහස් කොට ඉදිරිපත් කෙරේ.

සිසුන්ගේ ලිවීමේ කුසලතා මට්ටම ගැන විමසමින් 3 වසර සිසුන් ලිවීමේ දී දක්වන වැරදි ප්‍රතිචාර කවරාකාරවේ දැයි අධ්‍යයනය කෙරේ. ඒ සඳහා භාවිත පර්යේෂණ ක්‍රමය වන්නේ විස්තරාත්මක පර්යේෂණ ක්‍රමයයි.

දත්ත රැස් කිරීමේ කාර්යයේ දී නියැදියට අයත් පාසල් අතරින් අහඹු ලෙස තෝරා ගත් පාසල් 45 ක 3 වසර සිසුන්ගේ ලිවීම, පරිසරය හා ගණිතය යන අභ්‍යාස පොත් නිරීක්ෂණය අධ්‍යයනයේ ප්‍රථම පියවර ලෙස සිදු කෙරිණි. ඒ සඳහා 1995 ජනවාරි මාසය යොදා ගනු ලැබිණි.

උක්ත වර්ෂයෙහි I, II හා III යන වාර වලදී අවස්ථා තුනක දී පර්යේෂණ උපකරණ භාවිතා කොට ලිවීමේ දී දක්වන වැරදි ප්‍රතිචාර ඡෙඩුලයක් භාවිතය මගින් ගණනය සිදු කෙරිණි.

අධ්‍යයනයෙහි දී හඳුනාගත් පොදු වැරදි ප්‍රතිචාර සිංහල හෝඩියේ අක්ෂර අනුපිළිවෙළට පුවරු ගත කෙරේ. ශිෂ්‍යයින් ලිවීමේ දී දක්වනු ලැබූ වැරදි ප්‍රතිචාර ඒ ඒ පළාත් හා පාසල් වර්ග අනුව විශ්ලේෂණය මගින් දැක්වේ. එහිදී ප්‍රතිශත, කල්පිත

University of Colombo Library Sri Lanka

පරීක්ෂාව හා සහසම්බන්ධතා පරීක්ෂාව යන ක්‍රම ශිල්ප යටතේ දත්ත විශ්ලේෂණයට යොමු කර ඇත.

3 වසර භාර ගුරු භවතුන් වෙත ඉදිරිපත් කරන ලද ප්‍රශ්නාවලිය හා සම්මුඛ සාකච්ඡා අනුව ලිවීමේ කුසලතාව කෙරෙහි බලපාන සාධක වල ස්වභාවය කවරාකාර ලෙස බලපා ඇත්තේ ද යනු පරීක්ෂාවට භාජනය කොට ඇත. ශිෂ්‍යයින්ගේ ලිවීමේ කුසලතා වර්ධනය සඳහා නව ප්‍රතිකාර්ය අවශ්‍යතාව පිළිබඳව විශේෂයෙන් අවධානය යොමු කර යෝජනා ඉදිරිපත් කෙරේ.

ප්‍රතිකාර්ය පිළිබඳව සැලකීමේ දී පෙළපොත භාවිතයෙන් ශිෂ්‍යයා ලබන අත්දැකීම් කෙරෙහි සැලකිලිමත් වී ඇත. පෙළපොතෙහි අක්ෂර ව්‍යාප්තිය ගණනය කොට වාර බහුලතාව අනුව ලේඛන ගත කර ඇත. ශිෂ්‍යයා ලිවීමේ දී දක්වන වැරදි ප්‍රතිචාර කෙරෙහි පෙළපොත දක්වන බලපෑම පරීක්ෂාවට භාජනය කොට ඇත.

අධ්‍යයනයෙහි නිගමන වශයෙන් බටහිර, වයඹ හා මධ්‍යම පළාත් අනුව ද, පාසල් වර්ග අනුව ද, ලිවීමේ සාධනය විශ්ලේෂණය කොට ඇත.

ඒ ඒ පළාත් වල වැඩි දියුණු කළ යුතු පාසල් වර්ග කවරේ දැයි නිගමන ඉදිරිපත් වේ.

පරීක්ෂණ අනාවරණ වශයෙන් අක්ෂර වල ආරම්භක හා සමාප්තික අක්ෂරාංග නොසැලකීම, අක්ෂර වල ප්‍රමාණය ප්‍රමිතියකින් තොරවීම, අකුරු හා වචන අතර පරතරය, අක්ෂර වල වටකුරු ස්වභාවය, පිළි භාවිතය, නොසැපයෙන ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රම යන ගැටළු වලට ප්‍රධාන වශයෙන් ශිෂ්‍යයින් මුහුණු පා ඇති ආකාරය විමර්ශනයට භාජනය වේ.

ශිෂ්‍යයින්ගේ ලිවීමේ සාධන මට්ටම වැඩි දියුණු කර ගැනීම සඳහා පංති කාමර කළමණාකරණයට සුවිශේෂ වැදගත් බවක් හිමි වේ. ඒ අනුව ගුරු කාර්ය භාරය හා ඇගයීම් පිළිබඳ ගුණාත්මක ලක්ෂණ කෙරෙහි බලපාන යෝජනා ඉදිරිපත් කෙරේ.

අධ්‍යයනයෙන් ප්‍රකාශිත තොරතුරු අනුව ප්‍රතිකාර්ය නව ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රම සංවිධානය හා ගුරු පුහුණුව යාවත්කාලීනවීමේ වැදගත් භාවය කෙරෙහි ද අවධානය යොමු කිරීම ඉටු කර ඇත. එම ක්ෂේත්‍රයෙහි නවීකරණ අවශ්‍යතාවත්, භාෂාගාර භාවිතය, රාජ්‍ය නොවන සංවිධාන වල සහයෝගයත් ලබා ගැනීමේ අවශ්‍යතාව ගැන ද සඳහන් වේ. ඉදිරි පර්යේෂණ සඳහා යෝජනා කිහිපයක් ද යෝජිතය. මවුබස සිංහල පිළිබඳ පොදු ආකල්ප වර්ධනය හා සමාජ ප්‍රවණතාව අනුව බහුභාෂා කුසලතා වර්ධනයෙහි වැදගත් බව ද සලකා ඇත.

3 වසර ලිවීමේ කුසලතා වර්ධනයෙහි ලා අතිරේක වශයෙන් ප්‍රතිකාර්ය ඉගෙනුම් කට්ටලයක් සම්පාදනය කිරීමේ යෝග්‍ය බව ගැන ද අධ්‍යයනයෙන් අවධාරනය කෙරේ.